# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2077/57 - 2018 ජුනි මස 30 වැනි සෙනසුරාදා - 2018.06.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට මහනුවර උතුර - පාතදුම්බර ඒකාබද්ධ ජලසම්පාදන ව්‍යාපෘතියේ විලාන උඩගම සේවා ජලාශය හා ප්‍රවේශ මාර්ගය ඉදිකිරීම සඳහා විකල්ප ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍යව ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2018 ජුනි මස 25 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර",
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.
5/2/1/1389.

#### උපලේඛනය

මහනුවර දිස්ත්‍රික්කයේ, අකුරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 589 විලාන උඩගම ග්‍රාම නිලධාරී වසමේ, විලානගම ගමේ පිහිටි හපුගොල්ලවත්ත නමැති ඉඩමෙන් සම්පූර්ණ ප්‍රමාණයෙන් රූඩ් 01, පර්චස් 04 ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස :

| | | |
|---|---|---|
| *උතුරට* | : | අත්පත් කර ගැනීමට යෝජිත ඉඩමේ ඉතිරි කොටස ; |
| *නැගෙනහිරට* | : | අත්පත් කර ගැනීමට යෝජිත ඉඩමේ ඉතිරි කොටස ; |
| *දකුණට* | : | අත්පත් කර ගැනීමට යෝජිත ඉඩමේ ඉතිරි කොටස ; |
| *බටහිරට* | : | අත්පත් කර ගැනීමට යෝජිත ඉඩමේ ඉතිරි කොටස. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය* : 01. එන්. ජී. සෝමානන්ද මහතා,
343, වෙද නිවස, වෙලේමුල්ල, මිල්ලවාන.

07 - 466


1A - G 27970 — 18 (2018/06) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*